# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,267 — 1937ක්වූ ජනවාරි මස 15 වෙනි දිනවූ සිකුරාද.


# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## උපාධනීති.

**" බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901කේ ආඥාපණත."**

**මේ 1920ෙස් අංක 11 දරන පළාත් ආණ්ඩුසභා සම්බන්ධ ආඥාපණතේ 245 යන වගන්තිය හා බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901කේ අංක 25 දරන ආඥාපණතේ 5වෙනි 6වෙනි වගන්ති යටතෙහි හැටන්–දික්ඔය නගරබද ප්‍රදේශසභාව විසින් සම්පාදනයකරනලද උපනීති.**

ඒ. ජේ. ඇම්. ද සිල්වා,
නගරබද ප්‍රදේශසභාවේ සභාපතිතැන.

**මේ 1937ක්වූ ජනවාරිමස 6වෙනි දින හැටන්–දික්ඔය නගරබද ප්‍රදේශසභා කන්තෝරුවේදීය.**

### උපනීති.

**1.** හැටන්–දික්ඔය නගරබද ප්‍රදේශසභාවට අයත් සීමා තුළ තබාගෙන සිටින සෑම බල්ලා නොහොත් බැල්ලී ගැන ඒ සතා රැකබලාගන්නා එසේ නැත්නම් අයිතිකාරව ඉන්නා අය විසින් රුපියල් 1·50ක් බැල්ලියකුට සහ රුපියලක් බල්ලෙකුට ලියාපදිංචිකිරීම සඳහා අවුරුද්දපතා ගෙවන ගාස්තුවක් වශයෙන් ගෙවිය යුතුය. මේ ව්‍යවස්ථාව උදෙසා අවුරුද්ද ගණිනු ලබන්නේ එක් අවුරුද්දක අප්‍රේල් මාසයේ 1වෙනිද සිට ඊළඟ අවුරුද්දේ මාර්තු මස 31වෙනිද වනතුරුය.

**2.** ලියාපදිංචිකිරීමේ ගාස්තු අයකිරීම සඳහා නගරබද ප්‍රදේශසභාවේ සභාපතිතැන විසින් පත්කොට සිටින (මෙහි මින්මතු අයකරු යනුවෙන් සඳහන්වන) තැනැත්තාට එක් එක් අවුරුද්දේ ජනවාරි මාසේ 31වෙනිදට මත්තෙන් නගරය ඇතුළත සෑම ගෙදරකම වාසයකරන්නෙකු විසින් ඒ ගෙදර හෝ ගෙදරට ඇතුළත් අවට භූමියෙහි හෝ තබාගෙන සිටින එක් එක් බල්ලා හෝ බැල්ලිය සම්බන්ධව විස්තර කරුණු මීට යාකර තිබෙන A ආකෘතිපත්‍රයෙහි වුවමනා පරිද්දෙන් සපයාදිය යුතුයි.

**3.** යටකී අයකරුට හෝ නගරබද ප්‍රදේශසභාවේ ලේකම්තැනට හෝ නියමිත අයමුදල ගෙවූවිට B ආකෘතිපත්‍රයෙහිවූ පරිද්දෙන් ලියාපදිංචිකළ බවට සහතිකයක් දෙනුලැබේ.

**4.** (1) යම් බල්ලෙක් හෝ බැල්ලියක් හෝ ඉදින් :—

(*a*) අනිත් බල්ලන්ටද බෝවියහැක්කේයයි අයකරු හෝ ලේකම්තැන කල්පනාකරන ප්‍රමාණයකට රෝගයකින් පෙළේ නම් හෝ :

(*b*) වයස, ලෙඩ, තුවාළ යන මෙයින් කිසිවක් නිසා තවත් ජීවත්ව සිටින්ට සුදුසු නැතැයි තමන්ට කල්පනාවේනම්, එබඳු බල්ලක් හෝ බැල්ලියක් සඳහා ලියාපදිංචිකිරීමේ සහතිකයක් නොදෙන්නට අයකරු හෝ ලේකම්තැනට පුළුවන, නැතහොත් :

(2) ලේකම්තැන හෝ අයකරු මැනවයි සලකන කොයිම නියමයකට නමුත් යටත්කොට සහතිකයක් දෙන්නටද ඔහුට පුළුවන. එසේ සහතිකය නොදී හැරීම ගැන හෝ නියමයන්ට යටත්කිරීම ගැන නොසතුටු බල්ලන් අයිතිකාරයෙකුට ඊට විරුද්ධව නගරබද ප්‍රදේශසභාවේ සභාපතිතැන වෙත පැමිණිලිකර සිටින්නට පුළුවන. එවිට එසේ නොදී හැරීම හෝ නියමයන්ට යටත්කිරීම ස්ථිරකරන්ට හෝ මඳක් වෙනස් කරන්නට හෝ අවලංගුකරන්නට හෝ සභාපතිතැනට පුළුවන.

**5.** ලියාපදිංචිකිරීමේ සෑම සහතිකයකම පහත සඳහන් නියමයන් මුද්‍රණයකොට තිබිය යුතුයි, එනම් :—

(*a*) සභාපතිතැනගේ කල්පනාවේ හැටියට තවත් ඉදිරියට ජීවත්ව සිටීමට සුදුසු නොවන අන්දමට බල්ලා තුවාළව හෝ රෝගාතුරව සිටීනම් එක්කෝ—

(*b*) ඒ බල්ලාගේ අයිතිකාරයා ඌට නිතිපතා හිරිහැර කරන බව හෝ ඌ ගැන සොයා නොබලන බව හෝ සභාපතිතැනට ඒත්තුගියේනම් එක්කෝ—

(*c*) ඒ බල්ලාගේ බෝවෙන හෝ පැතිරෙන ලෙඩකින් පෙළෙමින් සිටියදී අනුන්ට අයිති වෙනත් බල්ලන් හා එකට ගැවසෙන්ට ඌ අයිතිකාරයා විසින් ඉඩහැරියේනම් මේ සහතිකය අවලංගුකරන්නට හැටන්–දික්ඔයේ නගරබද ප්‍රදේශසභාවේ සභාපතිතැනට පුළුවන.

**6.** සහතිකයක් දෙන්නට බැරියකියනුලැබ හෝ දෙනලද සහතිකයක නියමයන් අනුව ක්‍රියානොකිරීම හේතුකොටගෙන එය අවලංගුකරනුලැබ හෝ සිටින බල්ලකු හෝ බැල්ලියකු රැකබලාගෙන ඉන්නෙක් හෝ අයිතිකාරයෙක් හෝ වීනම් ඔහු විසින් නගරබද ප්‍රදේශසභාවෙන් ඒ සඳහා දැන්වීමක්ලත්විට එහි සඳහන් වේලාවට නගරබද ප්‍රදේශසභාවේ කන්තෝරුවට ඒ බල්ලා හෝ බැල්ලී ගෙනගොස් උන් භාරගන්ට බලය ලබාසිටින නගරබද ප්‍රදේශසභාවේ නිලධාරියකුට භාරදිය යුතුයි. එවිට එබඳු බල්ලන් සම්බන්ධව සභාපතිතැන නියමකරන පරිද්දෙන් ක්‍රියාකරනු ලැබේ.


23——J. N. 61578—146 (12/36)

7. 1901කේ අංක 25 දරණ බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපණත යටතේ හැටන්-දික්ඔයේ පලාත් ආණ්ඩුසභාව විසින් සම්පාදිතවූ, වර්ෂ 1936ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින නිකුත් අංක 8,261 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ වර්ෂ 1936ක්වූ දෙසැම්බර් මස 11වෙනි දින දරන ව්‍යවස්ථා මෙයින් අවලංගුකරනු ලැබේ.

A.—ආකෘති පත්‍රයයි.

බල්ලන් සම්බන්ධව උපනීතිවල නියමිත ලෙඛනයයි.

ගෙදර අංකය : ——

වීදිය · ——

ගෙහිමියාගේ නම : ——

| තබාගෙන සිටින බල්ලන්ගේ ගණන. | විස්තර. | | | | | | අයිතිකාරයාගේ නම. | ගාස්තුව ගෙවූ දිනය. |
|---|---|---|---|---|---|---|---|---|
| | ජාතිය. | පිරිමි සතාද, ගැහැණු සතාද. | පාට. | බෙල්ලේ මහත. | විශේෂ ලකුණු. | වැඩිදුර කරුණු. | | |
| | | | | | | | | මාර්තු මස 31වෙනිද හෝ ඊට පෙර |

ආකෘති පත්‍රය බාරදුන් දවස : ——.

——————,

ගෙහිමියාගේ අත්සන.

19 —— දින හැටන්හිදීය.

ඉහත සදහන් ගෙහිමියා විසින් ඉහත සදහන් ඇබුල්පත්‍රය පුරවා, සතියක් ඇතුලත එවිය යුතුයි. එසේ නොකර පැහැර හරින යම් කෙනෙක් වීනම් ඒ අය රු. 20ක දඩයකට යටත් වියහැක.

සභාපතිතැනගේ අණප්‍රකාර,

——————,

ලේකම්.

19 —— දින හැටන් නගරබද
ප්‍රදෙශසභා කන්තෝරුවේදීය.

B.—ආකෘති පත්‍රය.

බල්ලන් ලියාපදිංචිකිරීමේ සහතිකය.

වීදිය : ——. ලියාපදිංචිකිරීමේ අංකය :—— අංක ——

දරණ නම.

ගෘහයෙහි වාසයකරණ ——————, විසින් පහත සදහන් විස්තර ඇති බල්ලකු/බැල්ලියෙක් මේ කන්තෝරුවෙහි ලියාපදිංචිකළබවද, ඊට නියම ගාස්තුවවූ රුපියල් ———— ගෙවූබවද මෙයින් සහතිකකරමි.

බල්ලාගේ/බැල්ලීගේ විස්තර.

ජාතිය : ——.

පිරිමි සතාද ගැහැනු සතාද යන වග : ——.

පාට : ——.

බෙල්ලේ මහත : ——.

විශෙෂ ලකුණු : ——.

මේ සහතිකය වර්ෂ 19 —— මාර්තු මස 31වෙනිද වනතුරු බල සහිතව පැවතේ.

——————,

ලේකම්.

වර්ෂ 19 —— ක්වූ —— වෙනි දින හැටන් නාගරික ප්‍රදෙශ සභා කන්තෝරුවේදීය.

——————.

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,486 (මහනුවර).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තර සදහන් ඉඩම් වලින් කිසිවක් හෝ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1937ක්වූ ජනවාරි මස 15වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකලොත් එකී ඉඩම රජයන්තක ඉඩමකැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වනවගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජයන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1936ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ආර්. මොනිපෙනි,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත තුමාගෙන්ද, එවාගේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකක්වත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම්කීම හැටියට භාරගනු ලැබේ.

උප ලෙඛනය.

පහත සදහන් මධ්‍යම දිසාවේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩ පලාත කොට්ඨාසයේ ගංග ඉහල කෝරළේ හෙලිහුන්න යන ගමේ පිහිටා තිබෙන ඉඩම් කට්ටිය.

මූල් සිතියමේ නො. 6,631.

| සිතියම් කට්ටිය, | ඉඩමේ නම. | | විශාලත්වය, අ. රූ. ප. |
|---|---|---|---|
| 1 | පිටකන්ද | .. | .. 8 1 27 |

මීට මායිම්—උතුරට දෙල්ගොල්ල ඇල සහ බී. උන්දියා අයිතිකම් කියන අම්බගස්තැන්නේ කුඹුර; නැගෙනහිරට මල දෙල සහ බෙන්ජමින් රොද්‍රිගෝ මහත්මයා විසින් අයිතිකම් කියන අඹුල්ගම්ගහමුලහේන; දකුණට ආණ්ඩුවට අයිති පිට කන්ද සහ බස්නාහිරට දෙල්ගොල්ලඇල.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

Kandy No. 253,—මධ්‍යම දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සදහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1937ක්වූ පෙබරවාරි මස 26වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 10ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩබුලත්ගම කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි එකක්.

මූල් සිතියමේ නො. A 376. ගම—කොටියාගල (කොටගස්) අයිතිකම්කියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | බිම්කැබෙල්ලවම තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | කොටියාගලවත්ත .. | — | .. වත්ත සහ පනන, කොටියාගලවත්ත විසින් අල්ලාගෙන තිබේ | 0 1 28·7 | 177·75* |

* ආණ්ඩුව විසින් කොටියාගලවත්තෙන් මිලයට ගත් ඉඩම, ආපසු කොටියාගලවත්තට විකිණීම පිණිස.

මෙම ඉඩම සම්බන්ධ වැඩිදුර කාරණ මධ්‍යම දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, එහි සිතියම සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1937ක්වූ ජනවාරි මස 12වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

**Matale No. 81.**—මධ්‍යම දිසාවේ මාතලේ දිස්ත්‍රික්කයේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1937ක්වූ මාර්තු මස 10වෙනි දිනවූ බදාදා පෙරවරු 10ට මාතලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යොදනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුරු කෝරළයේ පිහිටා තිබෙන බිම්කැබලි දෙකක්.

අවසාන සිතියමේ නො. 40. ගම—පල්කඩ.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 21 | දඹගස්පිටියේහේන .. | ආණ්ඩුව .. | අවුරුදු 8 පමණ වයස්වූ රබර් .. | 0 1 5* |
| 24 | දඹගහපිටියේහේන | එම .. | එම (අකුරම්බොඩ ගෑප් කියන වත්තට අල්ලා වවා තිබෙන බිම්කට්ටි) | 0 1 32* |

* මෙම බිම්කට්ටි මිහවෙල අකුරම්බොඩ ගෑප් කියන වත්තේ අයිතිකාරයින් වන සීමාසහිත ද සිලෝන් කන්සොලිඩේටඩ් සහ සමාගමට තක්සේරු මිල අක්කරයකට රුපියල් හැත්තෑපහ බැගින් බේරුම්කරන්ට හෝ විකුණන්ට යෙදෙත්.

මෙම බිම්කට්ටි ගැන වැඩිදුර කාරණා මාතලේ උප ඒජන්තතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැක.

වර්ෂ 1937ක්වූ ජනවාරි මස 13වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඈල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පල්ලෙවෙල සාඛා දිස්පැන්සරියක් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නිසිආකාර මට අණ ලැබී තිබේ. ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 676. ගම—රත්දෙනි පල්ලෙවෙල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කඳුරුගහවත්ත .. | ස්ථිර ගොඩනැගිල්ලක් සහ අභිපාරක කොටසකින් යුත් හිස් ඉඩම | බී. බී. කොබ්බෑකඩුව, හාපිටිගම්කෝරළේ රිජිස්ත්‍රාර්, වෙවැල්දෙනිය සහ කේ. දේවරක්ඛිත තේරෝ, විද්‍යෝදය පිරිවෙන, මාලිගාකන්ද, කොළඹ | 0 0 8 |
| 2 | එම .. | අවුරුදු 20ක් වයස පොල් ගස් 2ක් සහ අවුරුදු 5ක් වයස ලැමත් ගහකින් යුත් ඉඩම | එම්, ඩබ්ලිව්. ඇලිස්හාමි, යාව ඉඩමේ කොටස්කාරයෙක් සහ කවුපිටියේ බේබිහාමි (දැනට පදිංචිව සිටින ස්ථානය දන්නේ නැහැ) | 0 0 8 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම් තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ පෙබරවාරි මස 15වෙනි දින පෙරවරු 10ගේ කාලයමට ලෙවියත්ගොඩ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1967ක්වූ ජනවාරි මස 11වෙනි දින කොළඹ කච්චේරියේදීය.

කාල්. ඊ. ආන්ඩි,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—අරමුනුකර තිබෙන ඉදිකඩ තනනන් මූකලානට ඇතුලත්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරීතිබෙන බලයපිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සප්ලිමන්ට් නො. 1. ඈෆ්. ඈස්. සිතියමේ නො. 49. ගම—හිඟුරල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 7 | අවිස්සාවේල්ලේවත්ත .. | කැලෑව .. | අවිස්සාවේල්ලේවත්ත, ජැනරල් සිලෝන් ට් ඈන්ඩ් රබර් ඇස්ටේට්ස් කොම්පැනිය | 0 2 35 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ පෙබරවාරි මස 24වෙනි දින පෙරවරු 10යේ කාලයමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ ජනවාරි මස 11වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඈස්. ඈෆ්. අමරසිංහ,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වෙනුව.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—අහස්යාත්‍රා නැවතුම්පොළට යන පාරේ බංගන්දිය දියුනුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රණසභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. A 674. ගම—රත්මලාන උතුර සහ රත්මලාන දකුන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | රත්මලාන ගෑප්, වරිපනම් නො. 582ඒ ඉඩමෙ කොටසක් | අවුරුදු 27ක් වයස පොල්ගස් 6ක් සහ අවුරුදු 10ක් වයස රබර්ගස් 2කින් යුත් පොල් වත්ත | ඈල්. ඩබ්ලිව්. ඒ. ද සොයිසා, කොල්ලුපිටිය | 0 0 7·82 |
| 2 | රත්මලාන ගෑප්, වරිපනම් නො. 627ඒ කොටසක් | අවුරුදු 17–27 වයස පොල්ගස් 5ක්ද, අවුරුදු 15 වයස පොල්ගහක් සහ අවුරුදු 15ක් පමණ වයස පුවක්ගස් 5කින් යුත් පොල්වත්ත | එම .. | 0 0 10 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ පෙබරවාරි මස 24වෙනි දින පෙරවරු 10·30ඒ කාලයමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ ජනවාරි මස 11වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඈස්. ඈෆ්. අමරසිංහ,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වෙනුව.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට එනම්:—අගලවත්ත–බදුරෙලියේ අවවෙනි හැතැක්මේ මගුරුගඟ හරහ දමා තිබෙන අලුත් පාලමට යෑමට තිබෙන පාර දිග්ගුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

ගම් පැලෑතේ නො. 123 දෙවෙනි අතිරේකය. ගම—බදුරලිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 466 | එන්දවලපැලස්ස .. | අවුරුදු 21ක් වයස ඇති රබර් ගස් 3ක් සහ උළු සෙවිලිකරපු ගොඩනැගිල්ලකින් කොටසක් ඇති වත්ත | බදුරලියේ පදිංචි දොන් ජෝන් ජයවර්ධන කන්නන්ගරගේ බබුන්නෝනා, කේ. එලාරිස්, කේ. සරනෙලිස්, කේ. දොන් බයස්, කේ. කරලිනාහාමි සහ මද්දුමගේ තෝමිස් | 0 0 4·8 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ පෙබරවාරි මස 12වෙනි දින පෙරවරු 10යේ කනිසමට බදුරලියේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ ජනවාරි මස 12වෙනි දින
කළුතර කච්චේරියේදීය.

ඇන්. ඒ. ආර්න්ස්ට්,
කළුතර ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—හොරණ රෙදිවියන ෆැක්ටරියක් හැදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ. ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 679. ගම—හොරණ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හැගල්ල .. | අවුරුදු 25ක් වයස ඇති පොල්ගහක්ද, අවුරුදු 8ක් වයස ඇති පුවක්ගහක්ද, අවුරුදු 3ක් වයස ඇති දෙහිගහක්ද, සිදරන්ගහක්ද, තේ පඳුරු ටිකක්ද, ගලෙන්බැඳි ලිඳක්ද, ස්ථිර ගොඩනැගිල්ලක් සහ තාවකාලික ගොඩනැගිල්ලක් ඇති වත්ත | හොරණ පදිංචි විල්මට් ඒ. පේරා | 0 0 15·7 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ පෙබරවාරි මස 16වෙනි දින පෙරවරු 10යේ කනිසමට හොරණ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ ජනවාරි මස 12වෙනි දින
කළුතර කච්චේරියේදීය.

ඇන්. ඒ. ආර්න්ස්ට්,
කළුතර ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—හොරවලගමට වැසිකිලියක් බදුගම නමැති ගමේ හැදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 641. ගම—බදුගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | දියකිතුලගොඩැල්ල | අවුරුදු 30ක් වයස ඇති පොල්ගස් 1ක්ද, අවුරුදු 10ක වයස ඇති පොල්ගස් 1ක්ද, අවුරුදු 1ක් වයස ඇති පොල්පැල 3ක්ද, අවුරුදු 10ක් වයස ඇති රබර්ගස් 6ක්ද, අතු සෙවිලිකරහලද වරිච්චි ගේක කොටසක්ද, කබුක්ගලින් හැදූ වැසිකිලියක්ද මේ ඉඩමේ තිබේ | බදුගම පදිංචි හේනගේ බබුන්හාමි | 0 0 13·9 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ පෙබරවාරි මස 12වෙනි දින පෙරවරු 11යේ කනිසමට මතුගම තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ ජනවාරි මස 12වෙනි දින
කළුතර කච්චේරියේදීය.

ඇන්. ඒ. ආර්න්ස්ට්,
කළුතර ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—හෝල්ලුවාගොඩ ඇලේ හොරොව්වක් හැදීම පිණිස ජල බහගෙන ලග ඇලකට පලල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

මුල් සිතියමේ නො. A 453. ගම—කඩවත් සතරේ ඕපාත.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මහතරකුඹුර .. | කුඹුර (අත්හැරදමා තිබේ) .. | පියදිගම සේ නමාහමදු .. | .. 0 0 16·11 |
| 2 | මැදගෙදරවත්ත .. | ඇලේ කොටසක්ඇතිහිස්බිම .. | ඕපාත පදිංචි ගුණියන්ගොඩගේ රිචඩ් | .. 0 0 3·28 |
| 3 | එම .. | එම .. | (1) ඕපාත පදිංචි විංජිතුංග බබුන්අප්පු, (2) ජී. ඇල්. චාර්ලිස්, (3) ජී. ඇල්. හෙන්රිස්, (4) ජී. ඇල්. හින්නිඅප්පු, (5) ජී. ඇල්. පොරෝලිස්, (6) ජී. ඇල්. කරෝලිස්, (7) ජී. ඇල්. උඩේරිස්, (8) ජී. ඇල්. කල්ලිනා සහ (9) පහලකිඹිය පදිංචි ජී. ඇල්. තෙනෝහාමි | 0 0 6 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
| --- | --- | --- | --- | --- |
| 5 | බදුවත්ත | .. ඇලෙන් සහ කොටසක් ඇති මුඩුබිම | (1) ඔපාත පදිංචි ගුනියන්ගොඩගේ හොපානිස්, (2) එම ජෙහානිස්, (3) එම මැන්දිස්, (4) එම ඊවෙල්, (5) එම හෝනි, (6) එම බස්තියන්, (7) කේ. බී. ජී. අදිරියන්, (8) නාගහවත්තගෙ අර්නොලිස් සහ (9) ගිංතොට පදිංචි ඉස්මාසිල් ලෙබ්බෙ මරික්කාර් මහම්මදු ඉබ්‍රාහිම් | 0 0 7·43 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ පෙබරවාරි මස 10වෙනි දින පෙරවරු 9යේ කාහිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අයුරෙ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ ජනවාරි මස 11වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගුනරත්න,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට එනම්:—ස්කෝලයක් හැදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් හිමිආකාරමට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

නො. 2,184 දරණ අවසාන සිතියමෙන් උපුටාගන්නාලද නො. 1 දරණ කොටස. ගම—වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොලහත්පත්තුවේ කටුගම්පොල උතුරු කෝරළේ පහල එලතලව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
| --- | --- | --- | --- | --- |
| 163 | කහටගහමුලවත්ත නොහොත් පින් තාලිගේහේන | පොල්වත්ත .. | එච්. ඇම්. හිංගිරිබන්ඩා, එච්. ඇම්. හිරිහාමි, එච්. ඇම්. පුංචිබන්ඩා, එච්. ඇම්. අප්පුහාමි, ඇල්. හිංගිරිබන්ඩා, ඇල්. පුංචිමැනිකා, ඇල්. උක්කුමැනිකා, ඇල්. මුතුමැනිකා, ඇල්. හිංගිරිමැනිකා, ඇල්. බංඩාරමැනිකා, පහල එලතලව, තිණව, එච්. ඇම්. රම්මැනිකා | 1 3 13·7 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ මාර්තු මස 2වෙනි දින පෙරවරු 10යේ කාහිසමට කුලියාපිටියේ නානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අයුරෙ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ ජනවාරි මස 8වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

සී. එච්. හාර්ට්වෙල්,
කුරුණෑගල ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

කරුවාවිටුකෝනියේ ස්වභාෂා මිශ්‍ර පාඨශාලාවට ඉඩම ලබාගැනීම.

වර්ෂ 1936ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින නො. 8,259 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන්වූ වර්ෂ 1937ක්වූ ජනවාරි මස 7වෙනි දින පෙරවරු 10ට කරුවාවිටුකෝනියේ පාඨශාලාවේදී පවත්වන්ට නියම්කරගෙන තිබුන විභාගය වර්ෂ 1937ක්වූ මාර්තු මස 10වෙනි දිනට එම ස්ථානයේම එම වේලාවටම දින දමන්ට යෙදුන බව මෙයින් දැනුම්දෙමි.

වර්ෂ 1937ක්වූ ජනවාරි මස 5වෙනි දින
මුල්ලද්දූවේ කච්චේරියේදීය.

පී. ඕ. ප්‍රනාන්දු,
ආණ්ඩුවේ උප ඒජන්ත තුමා

---

## ඉඩම් සංග්‍රහකිරීමේ දැන්වීමයි.

### දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

මෙහි පහත විස්තර දක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස දන්ඩගමුවේ නානායමේදී වර්ෂ 1937ක්වූ පෙබ්‍රවාරි මස 15වෙනි දින පූ. භා. 9ට 1935යේ අංක 19 දරන ඉඩම් සංග්‍රහකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් වයඹ දිසාවේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය වයඹ දිසාවේ ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

වර්ෂ 1937ක්වූ ජනවාරි මස 9වෙනි දින කොළඹ ඉඩම්
පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

### දීමට යන ඉඩමේ විස්තර.

පලාතේ අංකය හා නම—අවසාන සිතියමේ නොම්මරය 2,040. කටුගම්පොල හත්පත්තුවේ යටගම්පත්තුකෝරළේ අඟුරුව යන ගම.

| කැබැල්ලේ අංකය. | අවසරපත්‍ර දරන්නාගේ නම. | ප්‍රමාණය, අ. රූ. ප. |
| --- | --- | --- |
| 29 | අඟුරුව පදිංචි රණතුංග ආරච්චිගේ කිරිබණ්ඩප්පුහාමි | 0 3 10 |
| 30 | අඟුරුව පදිංචි රණවීර ආරච්චිගේ පුංචි අප්පුහාමි | 0 2 11 |

---

## ටෙන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක ඉඩම්වල අවුරුද්දක් තුළ මැණික් හෑරීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. "Tender for the Right to Gem" එනම් "මැණික් හෑරීමේ බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යනවචන ඇන්විලොප් එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1937ක්වූ ජනවාරි මස 27වෙනි දින පෙරවරු 10.30හ වනතුරු භාරගනිමින් කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරවන්ට ඕනෑය.

3. ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නාලද ඉල්ලුම් පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එවේලේම ගෙවන්ට ඕනෑය. තවද කොන්දේසි පිළිපැදීම ආදිය සඳහා බදු අවසරපත්‍රයකට ඇතුල්වෙන්ට ඕනෑය.

4. ඉල්ලීම භාරගත් දින සිට මාස තුනක් ඇතුළතදී ඉල්ලුම්කාරයා විසින් බදු අවසරපත්‍රයක් ලබානොගත්තොත් නම් ඔහු විසින් ගෙවනලද මුදල රජසන්තක වෙනවා ඇත.

5. බද්ද වලංගු කාලය තුළ බදුදෙන්ට යෙදුන ඉඩමේ ඇති ගස්වලට යම් අලාභයක් සිදුවෙන්ට හෝ නැතිනම් ඉදිරිවැටෙන්ට යෙදුනොත් එකී ගස්වල වටිනාකම බදුකාරයා විසින් ගෙවිය යුතුයි.

6. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම භාරනොගැනීමේද, ඉල්ලුම්පත්‍රයක යම් කොටසක් භාරගැනීමේද බලය සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නාලදී.

7. භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයන් විසින් තම තමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල පතල් ගොඩකිරීමාදියට සහ අවසරපත්‍රයේ කොන්දේසි කඩකිරීම වැලැක්වීමටත් සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් නියමකරන්ට යෙදෙනලද රුපියල් සියයකට (රු. 100) වැඩිනොවන මුදලක් එක එක ඉඩමට ඇප වශයෙන් කච්චේරියේ බඳින්ට ඕනෑය.

8. එක එක ඉඩමට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

9. ඉඩම් ඉල්ලුම්කාරයෝ තමතමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල වැඩ පවත්ගන්නා දින සහ වැඩ නවත්වන දිනද කොළඹ ලෝහ පරීක්ෂකතුමාට වෙත දන්විය යුතුයි. තවද එකී ලෝහ පරීක්ෂකතුමා පතල් විභාගයට ආමිට සියලුම පතල්වල වැඩ නවත්වා පරීක්ෂාකිරීමට ඉඩදිය යුතුයි.

10. වැඩිදුර කාරණ සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැකිවේ.

### ඉඩම්වල තොරතුරු.

(1) නවදුන්කෝරළේ කරපිට පිහිටි දිගින් දම්වැල් 80ක් පමණ විශාලකම ඇති ගිනිබොකුදෙලට මායිම :—

උතුරට: උමන්දුවේදෙල, ගිණිබොකුදෙලට වැටෙන ස්ථානයද.

නැගෙණහිරට: නො. 39යේ පැලෑනේ ලොට් නො. 11½ද.

දකුණට: නො. 39යේ පැලෑනේ ලොට් නො. 21B එකේ උතුරු බස්නාහිර කෙරවලද.

බස්නාහිරට: නො. 39යේ පැලෑනේ ලොට් නො. 58ද.

(2) කුකුළුකෝරළේ උඩුගල පිහිටි දිගින් දම්වැල් 64ක්ද සහ පලලින් දම්වැලක්ද පමණ විශාලකම ඇති පරගලගඟට මායිම :—

උතුරට : දෙල්ගහවල.

නැගෙණහිරට : නො. 239 පැලෑනේ ලොට් නො. 61, 84, 95, 132, 134 සහ 138ද.

දකුණට : කිතුල්ගහවල.

බස්නාහිරට : නො. 239 පැලෑනේ ලොට් නො. 63, 75B, 82, 83, 91, 94, 71L, 157, 154 සහ 155ද.

(3) කුකුළුකෝරළේ දෙල්ගොඩ පිහිටි දිගින් දම්වැල් 15ක්ද සහ පලලින් දම්වැල් ¼ක්ද පමණ විශාලකම ඇති මුල් ගොඩ්දර දෙලට මායිම :—

උතුරට: ගල්බැම්ම.

නැගෙණහිරට: නො. 1 දරන පැලෑනේ ලොට් නො. 151B, 151A සහ 27AZ.

දකුණට: මිනුවන්පිල සහ අඹුන.

බස්නාහිරට : නො. 1 දරන පැලෑනේ ලොට් නො. 27 සහ 2·DZ.

(4) කුරුවිටිකෝරළේ වලව්ට පිහිටි දිගින් හැතැප්ම ¼ක් පමණ විශාලකම ඇති ගැටහැති ඔයට මායිම :—

උතුරට: හල්දෙල වැටෙන ස්ථානය.

නැගෙණහිරට: ගැටහැතිඇලේ දකුණු ඉවුරද.

දකුණට: ඉළුප්පිටියේ ගම් මායිමද.

බස්නාහිරට: ගැටහැතිඇලේ වම්ඉවුරද.

(5) කුරුවිටිකෝරළේ කරදන පිහිටි දිගින් හැතැප්ම ¼ක් පමණ විශාලකම ඇති කරදනඇල නොහොත් මහඇලට මායිම :—

උතුරට : නො. 54 සිතියමේ ලොට් නො. 128වේ දකුණු කෙරවලද.

නැගෙණහිරට: වම්ඉවුරද.

දකුණට: අත්තක්කාදෙලවැටෙන ස්ථානයද.

බස්නාහිරට ; දකුණු ඉවුරද.

(6) මැදකෝරළේ බෙරෙන්දෙනියේ පිහිටි දිගින් දම්වැල් 2ක් පමණ විශාලකම ඇති බෙලිපත්කන්දුරේ ඇලට මායිම :—

උතුරට : බෙලිපත්කන්දුරේඇලේ ඉතුරුකොටස.

නැගෙණහිරට : බෙලිපත්කන්දුරේඇලේ වම්ඉවුර.

දකුණට : බෙලිපත්කන්දුරේඇලේ ඉතුරුකොටස.

බස්නාහිරට: කැලේ.

(7) අටකලන්කෝරළේ යාගුන්නේ පිහිටි දිගින් දම්වැල් 8ක් සහ පලලින් අඩි 42ක්ද පමණ විශාලකම ඇති මීරියන් දෙලට මායිම :—

උතුරට : තිප්පොලේහේන සහ හව්පේ ගෙවත්තද.

නැගෙණහිරට : ගල්ඇන්ද පල්ලේවල.

දකුණට : මාතාන රබර්වත්ත.

බස්නාහිරට : තිප්පොලේහේනේ සිවදෙලට අහ අඩිපාරද.

(8) කුරුවිටිකෝරළේ කැටවල පිහිටි දිගින් හැතැප්මක් පමණ විශාලකම ඇති ඉන්දුරුගඟට මායිම :—

උතුරට : වම් ඉවුරද.

නැගෙණහිරට : මියනපලදෙල වැටෙන ස්ථානය.

දකුණට : දකුණු ඉවුරද.

බස්නාහිරට : ඇතානාපුවල.

(9) කුරුවිටිකෝරළේ කුරුවිටි පාතගම පිහිටි නො. 255 සිතියමේ ලොට් නො. 111යේ කොටසක්වූ 111A අක්කර 5 පර්චස් 20ක් පමණ විශාලකම ඇති තිරුවානාගල්ගොඩ මූකලානට මායිම :—

උතුරට : ගෝනාපිටියේ ගම් මායිමද.

නැගෙණහිරට : ඌරුපැලැව්යායේ ගම මායිමද.

දකුණට : ලොට් 111B සහ නො. 255 සිතියමේ ලොට් නො. 111 ඉතුරු කොටසද.

බස්නාහිරට : ලොට් 111C සහ නො. 255 සිතියමේ ලොට් නො. 111 ඉතුරු කොටස සහ ගම්සභාපාරද.

(10) කුරුවිටිකෝරළේ කුරුවිටි පාතගම පිහිටි නො. 255 සිතියමේ ලොට් නො. 111යේ කොටසක්වූ 111B අක්කර 5 සහ පර්චස් 30ක්ද පමණ විශාලකම ඇති තිරුවානගල් ගොඩමූකලානට මායිම :—

උතුරට : ලොට් 111A සහ නො. 255 සිතියමේ ලොට් නො. 111යේ ඉතුරු කොටස.

නැගෙණහිරට : ඌරුපැලැව්යායේ ගම් මායිමද.

දකුණට : නො. 255 සිතියමේ ලොට් නො. 110.

බස්නාහිරට : ලොට් 111C සහ නො. 255 සිතියමේ ලොට් 111 ඉතුරු කොටසද.

(11) කුරුවිටිකෝරළේ කුරුවිටි පාතගම පිහිටි නො. 255 සිතියමේ ලොට් නො. 111යේ කොටසක්වූ 111C අක්කර 6 සහ පර්චස් 10ක් පමණ විශාලකම ඇති තිරුවානාගල් ගොඩමූකලානට මායිම :—

උතුරට : ගම්සභාපාරද.

නැගෙණහිරට : ලොට් නො. 111A සහ 111B නො. 255 පැලෑනේ ලොට් නො. 111 ඉතුරු කොටසද.

දකුණට : නො. 255 සිතියමේ නො. 110ද.

බස්නාහිරට : නො. 255 සිතියමේ ලොට් නො. 111E සහ 111Dද.

(12) කුරුවිටිකෝරළේ කුරුවිටි පාතගම පිහිටි නො. 255 සිතියමේ ලොට් නො. 111යේ කොටසක්වූ 111D අක්කර 4 සහ රූඩ් 1ක්ද පමණ විශාලකම ඇති තිරුවානාගල් ගොඩමූකලානට මායිම :—

උතුරට : ගම්සභාපාරද.

නැගෙණහිරට : ලොට් 111C සහ 255 සිතියමේ ලොට් 111යේ ඉතුරු කොටසද.

දකුණට : ලොට් 111E සහ 255 සිතියමේ ලොට් 111යේ ඉතුරු කොටසද.

බස්නාහාහිරට : නො. 255 සිතියමේ ලොට් 113.

(13) කුරුවිටිකෝරළේ කුරුවිටි පාතගම පිහිටි නො. 255 සිතියමේ ලොට් නො. 111යේ කොටසක්වූ නො. 111E අක්කර 3 රූඩ් 2 පර්චස් 20ක් පමණ විශාලකම ඇති තිරුවානාගල්ගොඩමූකලානට මායිම :—

උතුරට : ලොට් 111D සහ නො. 255 සිතියමේ නො. 111යේ ඉතුරු කොටස.

නැගෙණහිරට : ලොට් 111C සහ නො 255 සිතියමේ ලොට් 111යේ ඉතුරු කොටසද.

දකුණට : නො. 255 සිතියමේ ලොට් නො. 111යේ කොටසද.

බස්නාහිරට : නො. 255 සිතියමේ ලොට් නො. 112.

ඇම්. ඇල්. ඩී. කැස්පර්ස්,
සබරගමු පලාතේ මහා ඒජන්ත උන්නාන්සේ වෙනුවට,

වම් 1937ක්වූ ජනවාරි මස 1 වෙනි
දින රත්නපුරේ කච්චේරියේදීය.

---

### අන්‍ය දැන්වීමයි.

මෙහි පහත අත්සන්කරණ මහනුවර දිස්ත්‍රික්කේ පාත දුම්බර ගුන්නෑපාන යන ගම පදිංචි දොන් ඇල්බර්ට් ජයවීර වන මම අනුරාධපුර දිස්ත්‍රික්කේ නමන්කඩුව කොරළයේ පොලොන්නරුවේ සිංහල භාෂාවෙන් ඔප්පු ලියා සහතික කරණ ප්‍රසිඩ නොතාරිස් ධුරයට පත්වීම පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගතවූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලීමට අදහස්කරගෙන සිටිනබව නොතාරිස්වරුන් පිළිබඳ වම් 1907යේ අංක 1 දරණ ආඥාපණතේ B දරණ කැබුල් එකේ ප්‍රකාර මෙයින් දන්නුම්දෙමි.

ඩී. ඒ. ජයවීර.

ගුන්නෑපාන,
12 නොවැම්බර් 1936.